**පොල් වගාකිරීමේ මණ්ඩලය - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 49 වන ඡේදයට අනුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වත්කම අයත්වන වත්කම් පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් වාහන 288 කින් වාහන 272 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර රු.9,713,924 ක් පිරිවැය වූ වාහන 16 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් සියලුම වාහනවල ප්‍රත්‍යාගණන වටිනාකම 2023 වර්ෂයේ අවසන් ගිණුම් ප්‍රකාශනයන්හි ගැලපීම් කිරීමට කටයුතු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනයේදී එම වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 16හි 29 හා 30 ඡේදවලට පටහැනිව කොන්ත්‍රාත් 09 ක ඇස්තමේන්තු මුදල වූ රු.2,888,819ක් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කර කොන්ත්‍රාත් ණයහිමි ගිණුමට බැර කර තිබුණි. | වසර 02 ක් ඉක්මවන ලද හා මේවන විට නිමකරන ලද කොන්ත්‍රාත් සියල්ල හඳුනාගෙන 2023 වර්ෂයේදී නොනිම් වැඩ ගිණුමින් ගලපා නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | නිමකරන ලද වැඩ ප්‍රමාණයට අදාළ වියදම පමණක් කෙරීගෙන යනවැඩ ගිණුමේ දැක්විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 හි 47(අ) ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අවසන් තොගයෙහි ඇතුළත් ප්‍රතික්ෂේප හා අසාර්ථක පොල් ගෙඩි හා පොල් පැළ 649,101 ක වටිනාකම රු.4,536,707 ක් වූ තොගය අගය කිරීමට අදාළ නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් සහ පොල් පැළ තවාන්වලට අදාළ අසාර්ථක හා ප්‍රතික්ෂේප ඉතිරි තොග අගය කිරීමේදී වෙළඳපොළේ එවැනි තොග විකුණන ලද අවම මිල භාවිතා කර ඇත. | තොග අගය කිරීමේ නිශ්චිත ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වෙනත් ආයතන විසින් මණ්ඩලයේ භාවිතය සඳහා ලබා දී තිබුණු වාහන 17 ක් සමාලෝචිත වර්ෂයේදී රු.24,375,372 ක වටිනාකමට ප්‍රත්‍යාගණනය කර මණ්ඩලයේ දේපළ පිරියත උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයට අයිති නොමැති වාහන 16 ක් හඳුනාගෙන නොතිබූ අතර 2023 වාර්ෂික ගිණුම් ප්‍රකාශ සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | මණ්ඩලය විසින් භාවිත කරන වාහන මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර මණ්ඩලයට අයිති වාහන පමණක් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) ප්‍රත්‍යාගණනය කරන ලද වාහන 05 ක ප්‍රත්‍යාගණන වටිනාකම රු.1,275,000 ක් වුවද එය රු. 963,600 ක් ලෙස ගිණුම් ගත කර තිබීම නිසා ස්ථාවර වත්කම් රු.311,400 කින් අවප්‍රමාණය වී තිබුණි. | ප්‍රත්‍යාගණනය කරන ලද වාහන 05 ක ප්‍රත්‍යාගණන වටිනාකම අඩුවෙන් ගිණුම්ගත කිරීම 2023 වර්ෂයේ අවසන් ගිනුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වත්කම්වල ප්‍රත්‍යාගණන වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අයත් රු.1,950,000 ක් වටිනා වාහන 2 ක් මණ්ඩලයේ දේපළක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර 2016 වර්ෂයේ එම වාහන ආපසු භාර දී තිබුණ ද ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට නැවත භාර දී ඇති රු.1,950,000 ක වාහන 2 හි වටිනාකම 2023 වර්ෂයේ ගිණුම් ප්‍රකාශ සැකසීමේදී ස්ථාවර වත්කම් ලේඛනයෙන් ගැලපීම් කිරීමට කටයතු කර ඇත. | මණ්ඩලයට අයිති වාහන නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) මණ්ඩලයට අයිතියක් නොමැති වටිනාකම රු.13,095,245 ක් වූ ඉඩම් 17 ක් සමාලෝචිත වර්ෂයේදී ගිණුම් ගත කර තිබීම නිසා දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම අගයෙන් අධිගනණය වී තිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයට අයිති නොමැති ඉඩම් 2023 වර්ෂයේ ගිණුම් සැකසීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත උපකරණ යටතේ ගැලපීම් කිරීමට කටයුතු කර ඇත. | ඉඩම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ)මහයාය ආදර්ශ පොල් උයන් අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ අක්කර 331 රූඩ් 1 ක ඉඩම 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් මණ්ඩලය වෙත පවරා දී තිබුණද, එම වත්කම ගිණුම් ගත කර නොතිබුණු බැවින් ඉඩම් වටිනාකම අවප්‍රමාණය වී තිබුණි. | මහයාය ආදර්ශ පොල් උයනෙහි සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් පවරා දී ඇති අක්කර 331 රූඩ් 1 ප්‍රමාණයක් සහිත ඉඩමෙහි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා නොතිබීම 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | මණ්ඩලයට අයිති ඉඩම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් බදු පදනමට ලබාගෙන ඇති අක්කර 93 රූඩ් 1 පර්චස් 15 ක ඉඩම් සහ සේරුවාවිල මංගල රජමහ විහාරය වෙතින් ලබාගත් අක්කර 25 ක ඉඩම් සඳහා මේ දක්වා බදු ගෙවීම් කර නොතිබුණු අතර වෙන් කිරීමක් ද කර නොතිබුණි. | මහවැලි අධිකාරිය විසින් ලබා ගෙන ඇති ඇඹිලිපිටිය, උල්හිටිය තවාන් ඉඩම් හා සේරුවාවිල මංගල රජමහා විහාරය වෙතින් ලබාගෙන ඇති සේරුවාවිල තවාන් ඉඩම පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත ලබා දීමේදී ඉඩම් හිමියන් විසින් | අදාළ පාර්ශවයන් සමඟ විධිමත් බදු කුලී ගිවිසුම්වලට එළඹීම තුළින් හා කාලානුරූපීව බදු කුලී ගෙවීම තුළින් මූල්‍ය පාලන දුෂ්කරතා මඟ හැර ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| | මෙතෙක් අදාළ ඉඩම් සඳහා තක්සේරුවක් සිදුකර වාර්ෂික බදු කුලී නිවේදන ඉදිරිපත් කර නොමැත. එබැවින් බදු වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කර නැත. | යුතුය. |
| (උ) තොග සමීක්ෂණ වාර්තා අනුව මණ්ඩලය සතු වටිනාකම රු.9,517,861ක් වූ බිම් පොල් පැළ 48,683 ක් හා බඳුන් පොල් පැළ 4,483 ක් තොග ගිණුමට වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | 2022/12/31 දිනට භාණ්ඩ හා තොග සමීක්ෂණ වාර්තා අනුව බිම් පොල් පැළ ඒකක ප්‍රමාණය පරීක්ෂාකර අදාළ දෝෂය පසුකාලීන ගැලපුම් ගිණුමට මාරුකර නිවැරදි කර ඇත. | නිවැරදි තොග වටිනාකම ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කළ යුතුය. |
| (ඌ)සමාලෝචිත වර්ෂය අවසානයේදී පොල් වෙන්දේසිය තුළින් රු.230,305,040 ක ආදායමක් උපයා තිබුණු නමුත් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එය රු.235,153,803 ක් ලෙස ආදායම රු.4,848,763 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | වෙන්දේසියේ විකුණනු ලබන පොල් වෙනුවෙන් ලැබෙන සම්පූර්ණ මුදල් පොල් ආදායම ලෙස සටහන් කිරීම මෙතෙක් පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් කරන ලද ක්‍රමය වේ. එසේම ගිණුම් වර්ෂය අවසාන දිනට එලෙස වැඩිපුර ලද පොල් ආදායම, මුළු පොල් ආදායම තුළ ඇතුළත් වේ. 2023 වර්ෂයේදී මෙම වැඩිපුර ලද පොල් ආදායම ආපසු ගෙවන අවස්ථාවේ දී 2022 වර්ෂයට අදාළ වටිනාකම හඳුනාගෙන පසුකාලීන ගැලපුම් ගිණුමට ගලපා නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | පොල් වෙන්දේසි ආදායම මණ්ඩලයේ ගිණුම්වල නිවැරදිව දැක්විය යුතුය. |
| (එ) 2022 වර්ෂයේ දී වෙන්දේසියේ පොල් අළෙවි කිරීම වෙනුවෙන් තැරුව්කරු වෙත ගෙවිය යුතු සියයට 1 ක රු.2,326,314 ක තැරැව් ගාස්තුව මූල්‍ය ප්‍රකාශනයේ වගකීම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ සිට වෙන්දේසියේ විකුණනු ලබන පොල් වෙනුවෙන් අදාළ තැරැව්කාර සමාගම්වලට ගෙවිය යුතු (විකුණුම් මිලෙන් 1%ක්) 1% ක තැරැව් ගාස්තුව ණයහිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් කිරීමට කටයුතු කර ඇත. | තැරැව් ගාස්තු වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) 2022 වර්ෂය තුළදී වෙන්දේසි කරන ලද පොල් වලින් ගැණුම්කරු විසින් ප්‍රතික්ෂේප කරන ලද පොල් ගෙඩි 124,455 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.7,555,455 ක වටිනාකම වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වෙන්දේසියේ විකුණූ පොල් වෙනුවෙන් ලද ආදායම පොල් ආදායමට සටහන් කර ඇත. නමුත් එම පොල් තොගයේ ශුද්ධ ආදායම හඳුනාගනු ලබන්නේ අදාළ පොල් තොගය අයත් වත්තෙන් ගැනුම්කරු රැගෙන යන අවස්ථාවේදීය. ඒ අනුව ඉදිරි ගිණුම් වාර්තා පිළියෙල කිරීමේදී අදාළ ගිණුම වර්ෂය අවසන් වීමෙන් පසුව එම වර්ෂයට අදාළ වැඩිපුර ලද පොල් ආදායම | මූල්‍ය ප්‍රකාශනවල වගකීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ආපසු ගෙවන්නේනම් පසුකාලීන ගැලපුම් ගිණුමට සටහන් කිරීමට කටයුතු කර ඇත. | |
| (ඔ)2014 වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණු කුරුණෑගල කළමනාකරු නිල නිවස II අදියර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක නොවුවද මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.2,838,619 ක් කෙරිගෙන යන වැඩ ගිණුමට හර කර ණයහිමි ගිණුමට බැර කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම කොන්ත්‍රාත්තුව නැවත රු.2,897,636 කට පිරිනමා එම කොන්ත්‍රාත් වටිනාකම ද නැවත කෙරීගෙන යන වැඩ ගිණුමට හා ණයහිමි ගිණුමට සටහන් කිරීම නිසා කෙරීගෙන යන වැඩ ගිණුම හා කොන්ත්‍රාත් ණයහිමි ගිණුම රු.5,156,728කින් අධිගණනය වී තිබුණි. | කුරුණෑගල කළමනාකරු නිල නිවසේ ඉදිකිරීම් මේ වන විට අවසන් වී ඇති බැවින් 2022 වර්ෂයේ සිදු වී ඇති ගිණුම්කරණ දෝෂ සඳහා අදාළ ගැලපීම් සිදුකර 2023 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | නිමකරන ලද වැඩ ප්‍රමාණයට අදාළ වියදම පමණක් කෙරීගෙන යනවැඩ ගිණුමේ දැක්විය යුතුය. |
| (ඕ)වැඩ අවසන් වූ රු.2,760,971 ක් වටිනාකමැති කොන්ත්‍රාත් 3 ක් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ ලෙස පෙන්වා තිබුණි. | 2023.12.31 දිනට රු.2,760,971 ක් වටිනා කොන්ත්‍රාත්තුවේ කාර්යයන් මේවන විට අවසන්ව ඇති බැවින් 2023 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී නොනිමි වැඩ ගිණුමෙන්, ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. | ඉදිකිරීම් කොන්ත්‍රාත් අවසන් වූ පසු වැඩ අවසන් කිරීමේ සහතිකය මත වත්කම් නොපමාව ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ක)ලුණුවිල පොල් සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ කොන්ත්‍රාත්තුව සඳහා වූ ආරම්භක ශේෂයේ කොන්ත්‍රාත් ඇස්තමේන්තු වටිනාකම වූ රු.2,991,470 ක මුදල කෙරීගෙන යන වැඩ හා ණයහිමියන් තුළ ඇතුළත්ව තිබූණ අතර සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ඉවත් කර ගොඩනැගිලි නඩත්තු ගිණුමකට හර කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.1,766,425 ක මුදල ණයහිමි ගිණුම හර තිබූ අතර කෙරීගෙන යන වැඩ ගිණුම රු.1,766,425 කින් ද වර්ෂයේ අතිරික්තය රු.2,991,470 කින් අඩුවෙන් ද ණයහිමියන් රු.1,225,045 ක් වැඩියෙන් ද දක්වා තිබුණි. | ලුණුවිල පොල් සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයට අයත් නේවාසිකාගාරය හා කෑම කාමරය පුළුල් කිරීම පැරණි ගොඩනැගිල්ලෙහි සිදුකර තිබූ අලුත්වැඩියාවක් බැවින් සමාලෝචිත වර්ෂයේදී නඩත්තු හා අලුත්වැඩියා ගිණුමට හර කිරීමට කටයුතු කර ඇත. | ඉදිකිරීම් කොන්ත්‍රාත් හා අළුත්වැඩියා නිවැරදිව වර්ගීකරණය කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ග) වටිනාකම රු. 1,816,975 ක් වූ මයුරපුර පොල් පැළ තවානෙහි ජල සැපයුම් පද්ධතිය සමාලෝචිත වර්ෂය වන විට වැඩ අවසන් කර තිබුණද 2020 වර්ෂයේදී එම වටිනාකමින් රු.726,790 ක් පමණක් | හම්බන්තොට මයුරපුර පොල් පැළ තවානෙහි ජල සැපයුම ප්‍රාග්ධනිත කිරීමට හා අදාළ ක්ෂය ගැලපීම් සිදුකිරීමට 2023 වර්ෂයේදී කටයුතු කර ඇත. | කොන්ත්‍රාත් කටයුතු නිමවූ පසු වත්කම් ප්‍රාග්ධනිත කර ක්ෂය ගැලපීම්ද සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනිත කර ඉතිරි රු.1,090,185 ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර ක්ෂය ගැලපීමද සිදුකර නොතිබුණි. | | |
| (ච) රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයට අයත් වත්කම් රු.7,306,023 කින් ප්‍රත්‍යාගණනය කර තිබුණ ද රු.14,072,048 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා වත්කම් රු.7,306,025 කින් අධිගණනය වී තිබුණි. | රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයට අයත් ලීබඩු හා සවිකිරීම්වල ප්‍රත්‍යාගණිත වටිනාකම අධිගණනය වී තිබීම 2023.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වත්කම් ප්‍රත්‍යාගණනය කර නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ජ) නිල වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා කොටස් පදනමින් ගෙවන ලද රු.1,106,000ක මුදල ප්‍රාග්ධනිත කිරීම නිසා කාර්යාල උපකරණ හා ලී බඩු සවිකිරීම් ගිණුම අධිගණනය වී තිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිල වෙබ්අඩවිය නිර්මාණය කිරීම 2023 වර්ෂයේ අවසන්කර ඇති බැවින් එහි වටිනාකම අස්පෘශ්‍ය වත්කම් යටතේ පෙන්වීමට කටයුතු කර ඇත. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ට) මීගමුව බීජ පොල් ඒකකය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2017 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් වෙත රු.2,149,974 ක් ගෙවීම් කර කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. එම ඉදිකිරීම සිදු නොකිරීමට මණ්ඩලය තීරණය කිරීම නිසා එම වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණද අදාළ ගැලපීම් ගිණුම්වල සිදු කර නොතිබුණු අතර නීති මාර්ගයෙන් හෝ ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මීගමුව බීජ පොල් නිෂ්පාදන ඒකකයට අයත් නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පුද්ගලික උපදේශන ආයතනයකට රු.2,149,974.00 ක් උපදේශන ගාස්තු ලෙස 2017 වර්ෂයේදී ගෙවන ලදි. එහි දී අදාළ උපදේශන සමාගම විසින් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මි 459 ක් වැය වන බව ඇස්තමේන්තු කර ඇත. එපමණ විශාල පිරිවැයක් පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් දැරිය නොහැකි බැවින් ඒ වෙනුවට අදාළ ගොඩනැගිල්ල ඵලදායී ලෙස අලුත්වැඩියා කිරීමට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් තීරණය කර ඇත. | උපදේශන ගාස්තු නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඩ) 2022 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තා අනුව බඳුන් පොල් පැළ ඒකක ප්‍රමාණය 620,043 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය 624,526 ක් ලෙස ඒකක 4,483 ක් වැඩියෙන් දක්වා තිබුණු බැවින් බඳුන් පොල් පැළ අවසන් තොගයෙහි වටිනාකම රු.1,276,803 කින් වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි. | 2022/12/31 දිනට භාණ්ඩ හා තොග සමීක්ෂණ වාර්තා අනුව බඳුන් පොල් පැළ ඒකක ප්‍රමාණය පරීක්ෂාකර අදාළ දෝෂය පසුකාලීන ගැලපුම් ගිණුමට මාරුකර නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල බඳුන් පොල් පැළ තොගයේ වටිනාකම නිවැරදි කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ සේවකයන් අසූහය දෙනෙකු වෙත ලබා දී තිබූ එකතුව රු.1,062,332 ක ආපදා ණය ,උත්සව අත්තිකාරම් සහ විශේෂ වැටුප් අත්තිකාරම් වර්ෂ 05කට අධික කාලයක සිට හිඟව පැවතුණි. එසේම මාස 09 සිට අවුරුදු 05 දක්වා වූ කිසිදු වාරිකයක් අයකර නොගත් උත්සව අත්තිකාරම් ශේෂය රු.80,000 ක් හා සේවය හැර ගිය නිලධාරීන් 24 දෙනෙකුගෙන් අයවිය යුතු අවුරුදු 2 සිට 5 දක්වා කාලයක් හිඟව පවතින ආපදා ණය ශේෂය රු.870,321 ක් විය.මෙම මුදල් අයකර ගැනීම සඳහා මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයේ සේවකයන් වෙත ලබා දී ඇති හිඟව පවතින ආපදා ණය ඒ.එම්.ඩී.ඒ. බණ්ඩාර මයා හැර අනෙකුත් සේවකයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. ඒ.එම්.ඩී.ඒ. බණ්ඩාර මයාගේ සේවය මේ වන විට අත්හිටුවා ඇති බැවින් ආපදා ණය මුදල, ඉදිරියේදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. සේවකයන් 51 වෙත ලබාදී තිබූ රු.255,000.00ක විශේෂ වැටුප් අත්තිකාරම් මේවන විට අයකර ගැනීමට කටයුතු කර ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොන්ත්‍රාත් ණය හිමියන් 11 ක් වෙත ගෙවිය යුතු එකතුව රු.15,041,203 ක් හා නිලධාරීන් 11 ක් වෙත නොගෙවූ වැටුප් රු.335,607 ක් සඳහා වසර 2 සිට වසර 5 ට වැඩි කාලයක් ගත වී තිබුණද මණ්ඩලය විසින් මෙම ණයහිමියන් හා නොගෙවූ වැටුප් පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් ණය හිමියන් 11කගේ ගෙවිය යුතු ශේෂයෙන් නීතිමය ගැටලු පවතින කොන්ත්‍රාත්කරුවන් 4කගේ හැර ඉතිරි කොන්ත්‍රාත්කරුවන්ගේ ශේෂ 2023 වර්ෂයේදී ගිණුම් ප්‍රකාශ හි නිවැරදි කිරීමට කටයුතු කර ඇත. තවද නිලධාරීන් 11කගේ නොගෙවූ වැටුප් ශේෂ 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ඉදිකිරීම් කාර්යයන්ට අදාළව ගෙවිය යුතු මුදල් හා නොගෙවූ වැටුප් පිළිබඳ තොරතුරු සොයාබලා අදාළ ගනුදෙනු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 570 | වසර 02සිට වසර 08 දක්වා කාලය ඉක්මවා තිබුණු මණ්ඩලයේ ඉදිකිරීම් කාර්යයන් 53 කට අදාළ රු.5,163,054 ක රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතු නොකර | මණ්ඩලයේ ඉදිකිරීම් කාර්යයන්ට අදාළව පවතින රැඳවුම් මුදල් අදාළ කොන්ත්‍රාත් කාලයන් පරීක්ෂාකර 2023/12/31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් ප්‍රකාශහි නිරවුල් කිරීමට කටයුතු කර | ඉදිකිරීම් කාර්යයන්ට අදාළ රැඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙළඳ ණයහිමියන් යටතේ ගිණුම් ගත කර තිබුණි. | ඇත. | |
| (ආ) 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2020 හි 02 වගන්තිය, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 හි 2.3 ඡේදය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 මාර්තු 20 දිනැති අංක PED/P/02/15 (i) temp 3 දරන ලිපිය | ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධූරයේ නව පත්වීම් ලබාදීමෙන් වැලකී සිටීමටත් දැනට පත්වීමක් ලබා ඇත්නම්, සංස්ථාපනය කරන ලද පනත යටතේ එම තනතුර ඇති කර ඇත්නම් පනත සංශෝධනය කිරීමටත් උපදෙස් ලබා දී තිබුණද 2022 ඔක්තෝබර් 12 දිනැති ලිපිය මඟින් පොල් වගා කිරීමේ මණ්ඩලය සඳහා අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු පත්කර රියදුරෙක් සහිත වෙන්කල වාහනයක් හා මසකට ඉන්ධන ලීටර් 115ක් ද රු. 60,650 ක මාසික දීමනාවක් ද ගෙවීම් කර තිබුණි . | පොල් සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව පොල් වගාකිරීමේ මණ්ඩලයට සභාපති ධූරය සඳහාද නිල වශයෙන් අමාත්‍යතුමා විසින් පත්කරන ලද ආකාරයටම පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂක ධූරය සඳහාද ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු අමාත්‍යතුමා විසින් පත්කර ඇත. පනත ප්‍රකාරව පොල් වගාකිරීමේ මණ්ඩලයේ මෙම තනතුරු දෙක සඳහා පත්කිරීමට හා ඉවත්කිරීමට ඇති බලය අමාත්‍යවරයා සතුව ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ 7(5) ඡේදය | පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගය පාලනය කිරීම සඳහා හඳුනාගෙන තිබූ එකම ක්‍රියාමාර්ගය රෝගී ගස් ගලවා ඉවත් කිරීම වන අතර ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් තුළ යම් නිරෝධායන පළිබෝධයක් හෝ පළිබෝධ කිසිවක් ඇති බවට තොරතුරක් ලැබුණහොත් එය පාලනය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර වහාම ගත යුතු වුවද කපා ඉවත් කිරීම සඳහා සළකුණු කළ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ගස් 13,810 ක් කපා ඉවත් කිරීමට | රෝගී ගස් ඉවත් නොකිරීම රෝගය මැඩලීමට බාධාවක් බව පිළිගන්නා අතර වගාකරුවන් විසින් කපා ඉවත් කළ යුතුව තිබූ ගස් විශාල ප්‍රමාණයක් ක්ෂේත්‍රයෙන් ඉවත් නොකිරීම නිසා ඒ වන විට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ග්ලයිෆොසෙට් රසායනිකය එන්නත් කිරීම මඟින් ගස් විනාශ කිරීමේ ක්‍රියාවලිය සිදුකරන ලදි. නමුත් ග්ලයිෆොසෙට් රසායනිකය එම කාලය තුළ වෙළඳපොලෙහි නොමැති වීම නිසා මෙසේ රෝගී ගස් ක්ෂේත්‍රය තුළ ඉතිරි වී ඇත. | හඳුනාගෙන ඇති රෝගී ගස් වහාම ඉවත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කර නොතිබුණි. මෙසේ රෝගී ගස් ඉවත් නොකිරීම රෝගය මැඩලීමට බාධාවක් හා රෝග ව්‍යාප්තියට හේතුවන බවද නිරීක්ෂණය විය. | | |
| (ඇ) 2022 මැයි 05 දිනැති අංක CCB/Criu/CMG & ND/2022-01 දරන පොල් වගාකිරීම් මණ්ඩලයේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 1 වගන්තිය | යොමුගත චක්‍රලේඛය අනුව වැටෙන පොල් අස්වැන්න මුළු පොල් අස්වැන්නෙන් සියයට 10ක් නොඉක්මවන ලෙස මෙහෙයුම් කටයුතු කළ යුතු වුවද මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් 12 න් 08 කම 2022 වර්ෂයේ දී මුළු පොල් ඵලදාවෙන් වැටුණු පොල් ප්‍රමාණය සියයට 11 සිට 33 දක්වා පරාසයක විහිදී තිබුණි. | ආදර්ශ පොල් උයන්වල වැටුණු පොල් ප්‍රතිශතය 10 % නොඉක්මවන ලෙස කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ආදර්ශ පොල් උයන් කළමනාකරුවන් හට අප විසින් නිරන්තරයෙන් උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත. | වැටෙන පොල් ප්‍රමාණය අවම කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඉ) 2016 ජනවාරි 17 දිනැති අංක CCB/Criu/CMG & ND/2016-3 දරන පොල් වගාකිරීමේ මණ්ඩලයේ අභ්‍යන්තර චක්‍රලේඛය 1 (ii) හා 2 (i) වගන්ති | කිසිදු ඒකබීජ පත්‍ර ශාකයක් හෝ පාම් කුලයට අයත් ශාකයක්, දැවමය ප්‍රයෝජනයක් ලැබීම පරමාර්ථ නොකොට වගාකරන ලද එසේම ක්ෂේත්‍රය තුළ වෙනත් අංකනය කිරීමකට යටත් වූ ශාක ගස් පිළිබඳ ලේඛනයට ඇතුළත් නොකළ යුතු අතර කඳ වට සෙ.මී 60 ක් නොමැති ශාකද මෙම ලේඛනයට ඇතුළත් නොකළ යුතු වුවද නියැදි පරීක්ෂාවට අනුව රු.1,860,183 ක් වටිනා එම ගස්ද ලේඛනයට ඇතුළත් කර තිබුණි. | 2016 වර්ෂයේදී දැවගස් සංගණනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද CCB/Criu/CMG & ND/2016 අංක දරන චක්‍රෙල්ඛයේ යම් යම් අඩුපාඩු නිරීක්ෂණය වන බැවින් 2024 වර්ෂයේදී එය වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධන කිරීමට පියවර ගෙන ඇත. | අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුකූල විය යුතු අතර අවශ්‍යතාවය මත චක්‍රලේඛ සංශෝධනය කර අනුමත කරවා ගැනීම සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.389,622,417 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.611,134,769 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.221,512,352 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළදී ලද භාණ්ඩාගාර ප්‍රදාන රු. 1,179,002,363 සිට රු.622,520,000 දක්වා අඩුවීමත් අමාත්‍යාංශ ප්‍රදාන රු.මිලියන 404,760,440 සිට රු.මිලියන 218,424,000 දක්වා අඩුවීමත්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ තවාන් වියදම් රු.156,313,897 කින් වැඩිවීමත් මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසදා පහත පරිදි වේ.

| විෂයය | වර්ෂය | | විචලනය | විචලනය ප්‍රතිශතයක් ලෙස සියයට |
|---|---|---|---|---|
| | 2022 | 2021 | | |
| | රු. | රු. | රු. | |
| **ආදායම්** | | | | |
| පුනරාවර්තන ලැබීම් - භාණ්ඩාගාර | 394,520,000 | 500,000,000 | (105,480,000) | 21 |
| ප්‍රාග්ධන ලැබීම් - භාණ්ඩාගාර | 228,000,000 | 679,002,363 | (451,002,363) | 66 |
| අමාත්‍යාංශ ලැබීම් | 218,424,000 | 404,760,440 | (186,336,440) | (46) |
| **වෙනත් ආදායම්** | 1,729,554,844 | 1,248,622,320 | 480,932,524 | 39 |
| **වියදම්** | | | | |
| සංවර්ධන වැඩසටහන් වියදම් | 453,373,552 | 767,292,641 | 313,919,089 | 41 |
| මෙහෙයුම් වියදම් | 1,727,502,873 | 1,453,957,734 | 273,545,159 | 19 |

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් පිලිවෙලින් 11 : 1 ක් හා 7 : 1 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් පිළිවෙලින් 3 : 1 ක් හා **2 :** 1 ක් වී තිබුණි.
සමාලෝචිත වර්ෂයේදී තොගය හා කෙටි කාලීන ආයෝජන පිළිවෙලින් රු.126,057,168 කින් හා රු.713,680,908 කින් වැඩි වීම ජංගම හා ක්ෂණික වත්කම්වල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2022 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගය ව්‍යාප්ත වූ දිස්ත්‍රික්ක 3හි ග්‍රාම නිලධාරී වසම් 407 ක එම රෝගය පරීක්ෂා කිරීම සඳහා සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තාවට අනුව මණ්ඩලය විසින් ග්‍රාම නිලධාරී වසම් 257 ක පමණක් ඉඩම් පරීක්ෂා කර තිබුණි. එසේම මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 319න් 168ක පමණක් රෝගී ගස් පරීක්ෂා කර තිබූ අතර වසම් 151 ක ගස් පරීක්ෂාවට ලක් නොවී පැවතුණි. තවද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 06 ක එකදු ග්‍රාම නිලධාරී වසමක හෝ පිහිටි ඉඩම් පරීක්ෂා කර නොමැති බව විගණනයේදී අනාවරණය විය. රෝගී කලාපය ලෙස හඳුනා ගත් මාතර, | 2022 වර්ෂයේදී ගෙවීම් සඳහා ලැබුණු වවුචර් පත්‍රිකා අනුව ක්ෂේත්‍රයෙන් බවත් කරන ලද ගස් ගණන 8,388 ක් වන අතර, ගෙවීම් සඳහා ඉදිරිපත් නොවුවද වගාකරුවන් විසින් ඉවත් කරන ලද ගස් ගණන 9,527 ක් වේ. එන්නත් කිරීම මඟින් ඉවත් කරන ලද ගස් ගණන 735 කි. ඒ අනුව 2022 වර්ෂය තුළ මුළු ඉවත් කරන ලද ගස් ගණන 18,650 ක් වේ. 2022 වර්ෂයේදී ගස් 18,976 ක් සලකුණු කර ඇත. | රෝගී ගස් කඩිනමින් පරීක්ෂා කර එම රෝගී ගස් ඉවත් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගාල්ල,හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03 හි 2021 වර්ෂයේදී සළකුණු කළ රෝගී ගස් ගණන 7,681 ක් වූ අතර එය 2022 වර්ෂයේදී 18,976 ක් වී තිබුණි. එනම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 147 කින් වැඩි වීමක් වුවද 2022 වර්ෂයේදී කපා ඉවත් කල ගස් ප්‍රමාණය 9,044 ක් හෙවත් සළකුණු කළ රෝගී ගස් ගණනින් සියයට 47 ක් පමණක් විය. | | |
| (ආ)මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් 12 න් පොල් උයන් 8 ක පොල් වගාවට සුදුසු අක්කර ප්‍රමාණයෙන් සියයට 6 සිට සියයට 23 ක් දක්වා අඩු පරාසයක පමණක් පොල් වගාකර තිබුණි. | ගොඩනැගිලි, පාරවල්, පස්, විශාල ගස්, අධිබලැති විදුලි රැහැන් ආශ්‍රිතව පොල් වගා කළ නොහැකි ප්‍රදේශවල පවතින වපසරිය මෙසේ පොල් වගාවට සුදුසු භූමි ප්‍රදේශ ලෙස ඇතුළත් වී ඇති අතර, එම නිසා පොල් වගා කළ නොහැකි භූමි ප්‍රමාණය වැඩි වී ඇත. | මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන්වල වගාවට සුදුසු ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කළ යුතුය. |
| (ඇ) 2019 වර්ෂයේදී වාර්තා වූ සුදු මැස්සා රෝගය මර්ධනය කිරිම සඳහා පොල් පර්යේෂණ මණ්ඩලය විසින් 2022 වර්ෂයේ අග භාගයේදී නිර්දේශ කළ ස්වභාවික පිළියම් ලෙස සබන් වතුර,සබන් කුඩු වතුර ,කොහොඹ තෙල්වලට වතුර කලවම් කර රෝග කාරක ගස් සඳහා භාවිතා කිරීම ,කහ පැහැති පොලිතීන් ආවරණයක ග්‍රීස් ආලේපනය කර එම ආලේපනය සහිත පොලිතීනය ගසෙහි කඳෙහි එල්ලා තැබීම වැනි උපක්‍රම භාවිතා කිරීමට ජනතාව පෙළඹ වීමට සිදු කළද උසින් වැඩි පොල් ගස් සඳහා මෙම ක්‍රම ප්‍රායෝගිකව යොදා ගැනීමේ අපහසුව නිසා එකී පිළියම් රෝග මර්ධනයට සාර්ථක පිළියමක් වී නොමැති බව ද නිරීක්ෂණය විය. | පොල් පර්යේෂණ ආයතනය මගින් ලබාදෙන ලද නිර්දේශයන් පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව පොල් පර්යේෂණ ආයතනය මඟින් සුදු මැස්සා මර්ධනය සඳහා ලබාදෙන ලද සියලු නිර්දේශයන් අප ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදි. එම නිර්දේශයන් සමහර අවස්ථාවලදී ප්‍රායෝගිකව සිදුකිරීම අපහසු වුවත්, ඒ සඳහා අවශ්‍ය උපකරණ කඩිනමින් මිලදී ගෙන අදාළ නිර්දේශයන්ට අනුකූලව අප ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කර ඇත. | පොල් පර්යේෂණ මණ්ඩලය හා එක්ව සුදු මැස්සා රෝග පාලනයට හා මර්ධනයට තිරසාර ප්‍රතිකාරයක් කළ යුතුය. |
| (ඈ)මණ්ඩලය සතු පලෙයි, කොරෙයි, ගර්ට්ලන්ඩ් හා බෝපිටිය පොල් උයන් 4 හි ඵල නොදරන පොල් ගස් ප්‍රමාණය මුළු පොල් ගස් ප්‍රමාණයෙන් සියයට 50 කට වැඩි වුවද ඊට හේතු සොයා බලා පිළියම් යෙදීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි. | උතුරු නැගෙනහිර ප්‍රදේශවල පිහිටි ආදර්ශ පොල් උයන්වල වසර ගණනාවක් පැවති යුධමය වාතාවරණය හේතුවෙන් පැරණි වගාව විනාශ වී ඇති අතර, සංවර්ධන කටයුතු ද අඩාල විය. මේවන විට එම ආදර්ශ පොල් උයන්වල නව වගා හා යටි වගා විශාල ලෙස ආරම්භ කර ඇත. එබැවින් ඵල නොදරන පොල් ගස් ප්‍රමාණය ඉහළ අගයක් ගෙන ඇත. අනෙකුත් ආදර්ශ පොල් උයන්වලද යටි වගාව ආරම්භ කර ඇති බැවින්, ඵල නොදරන පොල් ගස් ප්‍රමාණය ඉහළ අගයක් ගෙන | මණ්ඩලය සතු පොල් උයන් වල ඵල දරන පොල් ගස් ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| | ඇත. ඉදිරි වර්ෂ කිහිපය තුළදී මෙම ප්‍රමාණය ඉතා අඩු අගයකට පත්කර ගැනීමට හැකි වනු ඇත. | |
| (ඉ)මණ්ඩලය සතු රන්දෙණිය, ගර්ට්ලන්ඩ්, ලේනව, කොහොඹාන, පාසිකුඩා, කොරෙයි, මුන්දලම හා පලෙයි පොල් උයන් 8 හි කළු කුරුම්ණි හානිය හේතුවෙන් විනාශ වූ පොල් ගස් සංඛ්‍යාව 2021 වර්ෂයට වඩා 59 කින්ද, පොල් කොළ නාශක දළඹු හානිය හේතුවෙන් විනාශ වූ පොල් ගස් සංඛ්‍යාව, 2021 වර්ෂයට සාපේක්ෂව 638 කින් ද වැඩි වී තිබුණි. සත්ව හානි උවදුරු සඳහා යොදාගත යුතු පිළියම් කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර හානිය අවම කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | ආදර්ශ පොල් උයන්වල විශාල වශයෙන් පැළ වගා ආරම්භ කර නඩත්තු කරන අතර, එම පැළ වගා සඳහා ප්‍රධාන වශයෙන් බලපාන කෘමි උවදුර වන්නේ කළු කුරුමිණි හානියයි. මේ වන විට එම හානිය අවමකර ගැනීමට කටයුතු කර ඇත.පාසිකුඩා ආදර්ශ පොල් උයනේ බ්‍රොන්ටිජ්සා හානිය ලෙස 2022 වර්ෂයේදී පොල් ගස් 638 ලෙස සටහන් වී ඇතත් එය පොල් කොළ නාශක දළඹු හානිය ලෙස නිවැරදි විය යුතුය. | විවිධ කෘමි උවදුරුවලින් වගාවන් ආරක්ෂා කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ඊ) 2023 ජුනි 07 දින සිදුකළ දැවමය වටිනාකමක් යුත් ගස් සංගණන වාර්තාව හා ගර්ට්ලන්ඩ් ආදර්ශ පොල් උයනේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ දැවගස් සංගණන තොරතුරු වාර්තාව සැසදීමේදී ගර්ට්ලන්ඩ් ආදර්ශ පොල් උයනේ දැව වර්ග 18 ක ගස් 301 ක් දැවමය වටිනාකම් සහිත සංගණන ලේඛනයට ඇතුළත් වී නොතිබුණු අතර දැව වර්ග 2 ක ගස් 12ක් එම දැවමය වටිනාකම සහිත සංගණන ලේඛනයේ වැඩිපුර ඇතුළත් කර තිබුණි . මෙසේ වැඩිපුර ඇතුළත්වූ දැවගස් ප්‍රමාණය 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු. 186,542,914 ක ශේෂය තුළ ද ඇතුළත් වී ඇති බව ද නිරීක්ෂණය විය. | මේ වනවිට අභ්‍යන්තර විගණන අංශය මඟින් ගර්ට්ලන්ඩ් ආදර්ශ පොල් උයනේ දැව ගස් සංගණනය පිළිබඳව පූර්ණ පරීක්ෂාවක් සිදුකර අදාළ නිවැරදි කිරීම් සිදුකර ඇත. | ආදර්ශ පොල් උයන්වල දැවමය වටිනාකම් සහිත ගස් පිළිබඳ සංගණන ලේඛනයේ නිවැරදි තොරතුරු ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශනයේ ශේෂය නිවැරදි කළ යුතුය. |
| (උ)වැවිලි අමාත්‍යාංශය, ක්‍රීඩා අමාත්‍යාංශය, පොල් සංවර්ධන අධිකාරිය, මුදල් අමාත්‍යාංශය හා ද්වීතිය කෘෂිකර්ම ව්‍යාපෘතියට අයත්ව තිබුණු රු.30,202,375 ක් වටිනා වාහන 17ක් මණ්ඩලය විසින් භාවිතා කරමින් පැවතියද එම වාහන මණ්ඩලය වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණු අතර ඉන් වාහන 7ක් සඳහා රු.3,207,905 ක අළුත්වැඩියා වියදම් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි .මින් වාහන 4ක් ධාවන තත්ත්වයේද නොවීය. | පොල් වගාකිරීමේ මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයක් වන බැවින් රජයේ වාහනයක් ඍජුව පැවරීමට කටයුතු නොකරන බැවින් අප විසින් මෙම වාහනවල ලේඛන සොයා මේ වන විට වාහන 09 ක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නමට පවරාගෙන ඇත. මෙම වාහනවල අයිතිය මණ්ඩලය සතු නොවූවද දීර්ඝ කාලීනව පොල් වගාකිරීමේ මණ්ඩලයේ රාජකාරී කටයුතු සඳහා යොදාගනු ලබන ධාවනයේ පවතින වාහන වනු ඇත. එම වාහන ධාවන තත්ත්වයේ පවත්වා ගැනීම සඳහා ඉන්ධන,සේවා, නඩත්තු ගාස්තු | මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන වාහන විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වශයෙන් 2022 වර්ෂයේ රු.3,207,905 ක මුදලක් වැය කර ඇත. | |
| (ඍ)සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් 12 න් 9 කම ඇස්තමේන්තුගත පොල් ඵලදාව හා සත්‍ය පොල් ඵලදාව සැසඳීමේදී අපේක්ෂිත ප්‍රමාණයට වඩා සත්‍ය ඵලදාව සියයට 2 සිට 19 ක පරාසයකින් අඩු වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී ආදර්ශ පොල් උයන් 12න් පොල් උයන් 5 ක පොල් ඵලදාව 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 2 සිට සියයට 10 කින් අඩු වී තිබුණි. | රටේ පැවති රසායනික පොහොර හිඟය නිසා වසර කිහිපයක් පොල් වගාව සඳහා පොහොර යෙදීමට නොහැකි විය. එය ඵලදාව අඩුවීම කෙරෙහි ඍජුව බලපෑම් ඇති කරන අතර, 2024 වර්ෂයේ සිට නියමිත පරිදි රසායනික පොහොර යෙදීම ආරම්භ කර ඇති බැවින්, ඉදිරි වර්ෂවලදී පොල් ඵලදාව වර්ධනය කර ගැනීමට හැකියාව ඇත. | සත්‍ය පොල් ඵලදාව වැඩිකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |
| (එ) මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් 12 හි 2020, 2021 හා 2022 වර්ෂයන්හි පොල් පර්යේෂණ ආයතනය හඳුන්වා දී තිබුණු පොල් ප්‍රභේද වූ CRIC 65 (කොළ), CRIC 65 (කහ), TSR, කප්රුවන, කප්සුවය, කප්සෙත, හා DT දෙමුහුන් පැල හා තැඹිලි පැල කිසිවක් පැල කිරීම සිදුකර නොතිබුණු අතර පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශිත පැළ අතර නොවූ PP2 වර්ගයේ පැල 2021 වර්ෂයේදී 86,499 ක් ද හා 2022 වර්ෂයේ 195,703 ක් ද මණ්ඩලයේ පොල් උයන්වල සිටුවා තිබුණි. | උසස් වර්ගයේ බීජ පොල්, පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබාදෙනු ලබන්නේ පොල් පර්යේෂණ ආයතනය මගිනි.වාර්ෂිකව එම බීජ පොල් ඉතා සුලු ප්‍රමාණයක් නිෂ්පාදනය කරන බැවින් ආදර්ශ පොල් උයන්වල තවාන් කිරීම සඳහා එම බීජ පොල් 2021,2022 වර්ෂවල ලැබී නොමැත. | පොල් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත උසස් වර්ගයේ බීජ ලබාගෙන පැළ සකස් කළ යුතුය. |
| (ඒ)මණ්ඩලයට අයත් සියළු ආදර්ශ පොල් උයන්හි පාලු පැල සිටුවීම පිළිබඳ පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂයේ මහයාය පොල් උයනේ පාලු පැල සිටුවා නොමැති අතර රන්දෙණිය, ගර්ට්ලන්ඩ්, ලේනව, ඩේසිවැලි, කොහොඹාන, කොරෙයි, මුන්දලම, පලෙයි යන පොල් උයන් 8හි සිටුවා ඇති පාලු පැළ ප්‍රමාණයට වඩා වැඩි පාලු පැල ප්‍රමාණයක් තව දුරටත් සිටුවීමට තිබුණි. පාලු සිටුවීමේ කාර්යය නිසියාකාරව සිදු වී නොමැති බවත් සිටුවා ඇති පැළ ගණනට සාපේක්ෂව සිටු වීමට ඇති පැල ප්‍රමාණය වැඩි අගයක් ගන්නා බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ රටතුළ පැවති ආර්ථික අස්ථාවරභාවය හේතුවෙන් සැලසුම්කර තිබූ පාළු පොල් පැළ සිටුවීමේ කාර්යයට අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර, ඉන්ධන හා ශ්‍රමය නිසි ආකාරව ලබා ගැනීමට නොහැකි වූ අතර, එම නිසා මෙම කාර්යය නිසි පරිදි සිදු කිරීම අපහසුවිය. මේ වන විට එම පුරප්පාඩු පැළ සිටුවා අවසන් කර ඇත. | මණ්ඩලය විසින් පාළු පැළ සිටුවීමේ කාර්යය කාලානුරූපීව සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඔ)මණ්ඩලය සතු වාහන 77 සඳහා අනුමත රියදුරන් සංඛ්‍යාව 50ක් පමණක් වන අතර ප්‍රධාන කාර්යාලය ,ආදර්ශ පොල් උයන් ,ප්‍රාදේශීය කාර්යාල සහ තවාන් හි රියදුරන් 35ක් පමණක් සේවයේ යෙදී සිටී .එසේම ප්‍රධාන කාර්යාලයේ භාවිතා කරන වාහන 18ක් සඳහා රියදුරන් 6 ක් පමණක් අනුයුක්ත සිටින බැවින් රාජකාරී කටයුතු සඳහා ප්‍රමාණවත් රියදුරන් නොමැතිව වාහන නිශ්කාර්යව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | මණ්ඩලයේ පවතින රියදුරු පුරප්පාඩු ඇතුළුව සමස්ථ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත 2024.01.02 හා 2024.03.05 දිනැති ලිපි මඟින් විස්තර වාර්තා යොමුකර ඇති බැවින් ඊට ලැබෙන උපදෙස් පරිදි ඉදිරියේදී බඳවා ගැනීම් කටයුතු සිදුකිරීමට නියමිතව ඇත. කෙසේ වුවද පවතින රියදුරු හිඟය යටතේ අප විසින් මණ්ඩලයේ ව්‍යාප්ති හා සංවර්ධන සේවා කටයුතුද ඇතුළුව මණ්ඩලීය පරිපාලනමය රාජකාරී අවශ්‍යතාවයන් සඳහාද රාජකාරී කටයුතු අඛණ්ඩව හා ඵලදායීව ඉටුකරනු ඇත. | අත්‍යාවශ්‍ය රියදුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කඩිනම් කිරීම තුළින් මණ්ඩලයේ වාහන ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඕ)මණ්ඩලය විසින් රෝගී ගස් ඉවත් කළ පොල් වගාකරුවන් සඳහා විකල්ප බෝග පැළ ලබාදීමෙදි 2021 වර්ෂයේ වගාකරුවන් 203 දෙනෙකුගේ ඉඩම් අක්කර 243.5ක් සඳහා කුරුඳු,කෙසෙල්,පළතුරු,ගම්මිරිස්, කහ වැනි විකල්ප බෝග පැළ ලබාදී තිබුණද 2022 වර්ෂයේදී වගාකරුවන් 110 දෙනෙකුගේ ඉඩම් අක්කර 161.75ක් ප්‍රමාණයකට පමණක් විකල්ප බෝග පැළ ලබාදීම සිදුකර තිබුණි. | සැලසුම්කළ පරිදි ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි වූයේ සුදුසුකම් සපුරා ඇති වගාකරුවන් නොමැති වීම සහ විකල්ප බෝග සඳහා වගාකරුවන් කැමැත්තක් නොදැක්වීම වේ. විකල්ප බෝග ලබාදීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් උපරිම උත්සාහයක යෙදී ඇත. | ඉවත් කරන ලද පොල් ගස් වෙනුවට විකල්ප බෝග පැළ ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ක) මණ්ඩලය විසින් 2008 වර්ෂයේ සිට පොල් කොළ කුණුවීමේ හා කොළ මැලවීමේ රෝගය සඳහා තාවකාලික ක්ෂේත්‍ර පරීක්ෂක නිලධාරීන් සේවයට බඳවා ගෙන මාස 06 න් 06 ට සේවා දිගුවක් ලබා දී තිබුණි. දකුණු පළාත තුළ වූ ග්‍රාම නිලධාරි වසම් 408 ක් ආවරණය සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් 43 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ රාජකාරී කර තිබුණු බැවින් ඉහත සියළු ග්‍රාම නිලධාරි වසම් ආවරණයට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වර්ෂය තුළ ගස් ලකුණු කිරීම් ප්‍රමාද වී ඇති බවද විගණනයේදී නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන් වී ඇත්තේ ක්ෂේත්‍ර නිලධාරීන් 43 දෙනෙකු සඳහා පමණක් වීම තුළ අමාත්‍යාංශ අනුමැතිය ලැබුණේද ක්ෂේත්‍ර නිලධාරීන් 43 දෙනෙකු බඳවා ගැනීම සඳහා පමණි. එබැවින් එම නිලධාරීන් ප්‍රමාණය යොදවා ගෙන සිදුකළ හැකි උපරිම ආකාරයෙන් මෙම කාර්යය සිදු කරන ලදි. | රෝග පාලනය හා මර්ධනය කිරීමේ කාර්යයන් කඩිනම් කිරීමට ප්‍රමාණවත් ක්ෂේත්‍ර නිලධාරීන් යෙදවිය යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගර්ට්ලන්ඩ් පොල් උයනේ වැට ශුද්ධ කිරීම සඳහා ටෙන්ඩරය භාර දී තිබුණු බාහිර පුද්ගලයින් දෙදෙනෙකු විසින් උඩුගම බෙදුමේ වැට සකස් කිරීමේදී බිම් මට්ටමින් කැටකැල ගස් දෙකක් 2023 ජූලි 29 දින නිසි අවසරයකින් තොරව කපා දමා | මේ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදුකර චෝදනා පත්‍ර ලබාදී වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගෙන ඇත. | දැවමය වටිනාකම් ඇති ගස් සංගණනය කර ලේඛන ගතකර ඒවායේ ආරක්ෂාව තහවුරු කළයුතු අතර |

| | | |
|---|---|---|
| තිබුණු අතර 2016ජනවාරි 17 දින නිකුත් කළ අංක CCB/Criu/CM68ND/2016-3 චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව ගසක් ඉවත් කළ හැක්කේ පාලන අධිකාරියේ ,ප්‍රාදේශීය ලේකම් ,මධ්‍යම පරිසර අධිකාරියේ හා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය මත වුවද මෙසේ ගර්ට්ලන්ඩ් වතුයායේ නිසි අවසරයකින් තොරව බිම හෙලන ලද කැට කැල ගස් දෙක විගණන ක්ෂේත්‍ර පරීක්ෂා කළ දින වූ 2023 ඔක්තෝබර් 26 දිනටත් කිසිදු කටයුත්තක් සිදු නොකර උඩුගම බෙදූම් කොටසේ තබා තිබුණි. මෙසේ නිසි අවසරයකින් තොරව බිම හෙලී ඇති කැටකැල ගස් දෙක පිළිබඳව ගර්ට්ලන්ඩ් වත්තේ වතු නිලධාරීන් නිසි අධීක්ෂණයකින් තොරව සහ අපරීක්ෂාකාරීව කටයුතු කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | | අනවසර දැව හෙලීම් නැවැත්වීමට නොපමාව පියවර ගත යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)පොල් වගාකිරීමේ මණ්ඩලය 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට සුදු මැස්සා හානිය මර්ධනය කිරීම සඳහා වැඩ සටහන් ඇතුළත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සුදු මැස්සා හානිය මර්ධනය කිරීමට නොහැකි වී තිබුණි. මෙම උවදුරට ස්වභාවික හා තාවකාලික පිළියමක් ලෙස කොහොඹ තෙල් මිශ්‍රණය යොදාගත යුතු වුවද ඒ සඳහා අවශ්‍ය කොහොඹ තෙල් මිලදී ගැනීම වර්ෂය අවසානය දක්වා සිදුවී නොතිබුණි. සබන් මිශ්‍ර කොහොඹ තෙල් ඉසීම වැනි ස්වභාවික පිළියම් අනුගමනය කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2022 වර්ෂයට වඩා වැඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රමාණයක 2023 වර්ෂයේදී රෝගය ව්‍යාප්ත වී තිබුණි. | සුදු මැස්සාගේ හානිය වසංගත තත්වයක් දක්වා වර්ධනය වූයේ 2022 වර්ෂයේ අවසාන කාලයේදීය. අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද විශේෂ ව්‍යාපෘති යෝජනාවලියක් හරහා මෙම උවදුර පාලනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත ලබාදෙන ලද්දේ 2022 වර්ෂයේ අග භාගයේදීය. ඒ අනුව කඩිනමින් කෙහොඹ තෙල් මිලදීගෙන 2023 වර්ෂයේ දී මෙම ආපදා තත්ත්වය සම්පූර්ණයෙන්ම පාලනය කර ඇත. | ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කිරීම තුළින් රෝග මර්ධන ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ)විධිමත් පෙර ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 30 දින මණ්ඩලයේ සභාපති විසින් කොහොඹ තෙල් ලීටර් 20,000ක් සැපයීමට ඉදිරිපත් කළ සැපයුම් ප්‍රදානය කිරීමේ ලිපියේ, 2022දෙසැම්බර් 31දිනට පෙර එනම් දින එකක කාලයක් තුළ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය වෙත සැපයීමට සැපයුම්කාර ආයතනයට දන්වා තිබුණ ද සැපයුම්කාර ආයතනය විසින් සම්පූර්ණ තෙල් තොගය සැපයීම 2023 අප්‍රේල් 5 දින දක්වා මාස 3ක කාලයක් ගෙන තිබුණි. | අදාළ සැපයුම් ආයතනය විසින් 2023.01.31 වන දින ලීටර් 2062.5 ක කොහොඹ තෙල් ප්‍රමාණයක් පළමු ඇණවුම් ලෙස පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත ලැබුණි. එම තොගය කඩිනමින් සියලුම ප්‍රාදේශීය කාර්යාල වෙත බෙදා හැරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. | ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කිරීම තුළින් රෝග මර්ධන ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) පොල් වගාකිරීමේ මණ්ඩලය සතු අංක GH-0804 දරන ලොරි රථය අළුත්වැඩියාව සඳහා 2018 ජූලි | GH-0804 ලොරි රථය 2018 වර්ෂයේ Lanka Ashok Leyland | අළුත්වැඩියා සඳහා භාරදුන් වාහන වලට |

| | | |
|---|---|---|
| 16 දින ලංකා අශොක් ලේලන්ඩ් සමාගම වෙත භාර දී තිබුණු නමුත් 2023 දෙසැම්බර් 31දක්වා මෙම වාහනය අළුත්වැඩියා කර මණ්ඩලය වෙත ලැබී නොතිබුණි .එසේම 2023 දෙසැම්බර් 29 දින මණ්ඩලය විසින් එම සමාගම වෙත රු.1,972,927 ක් ගෙවීම් කර තිබුණි. | ආයතනය වෙත අළුත්වැඩියාවට භාර දී තිබුණු අතර බොහෝ කලක් ධාවනයෙන් ඉවත් කර අබලන් තත්ත්වයේ තිබුණු රථයක් වූ බැවින් මෝටර් රථ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්කොට නිර්දේශයක් ලබා ගැනීමට නිලධාරියෙකු සම්බන්ධ කර ගැනීමේ අපහසුතාවය මත හා මෙම මාදිලියේ ලොරි රථ වල බොඩි කොටස් ඒජන්ත සමාගමේ නොමැති වීම මත ඇස්තමේන්තු සැකසීමද ප්‍රමාද විය. එවකට පැවති මිල ගණන් යටතේ අලුත්වැඩියාවට රු.982,476 ඇස්තමේන්තුවක් ලබා දී තිබුණද පැවති කොරෝනා තත්ත්වයන් යටතේ හා ආනයන අපනයන සීමා යටතේ අමතර කොටස් ගෙන්වීමට තිබුණු අපහසුතාවය මත එම ඇස්තමේන්තු ගත අලුත්වැඩියාව සිදු කිරීම ප්‍රමාද වී ඇත. | අදාළ කාර්යයන් නොපමාව අවසන්කර නිසි වේලාවට මණ්ඩලය වෙත ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) මණ්ඩලය සතු PF-3332, 19 -6812 හා 31-9900 දරන මෝටර් රථ අළුත්වැඩියාව සඳහා පෞද්ගලික සමාගම් දෙකක් වෙත භාර දී වසර 2 කට වැඩි කාලයක් ගත වුවද අළුත්වැඩියා කටයුතු අවසන් කර මණ්ඩලය වෙත භාර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණු අතර මෙම වාහනවල අළුත්වැඩියා කටයුතුවල ප්‍රගතිය පරීක්ෂා කර කඩිනම් කර ගැනීමට මණ්ඩලය කටයුතු කළ බවත් නිරීක්ෂණය නොවීය. | අංක PF-3332 දරණ රථය පෙන්වා දී ඇති පරිදි 2021.09.03 දින පැලියගොඩ අධිවේගී මාර්ගයේදී සිදු වූ අනතුරක් සම්බන්ධව රක්ෂණ ආවරණය යටතේ අලුත්වැඩියා කර ගැනීම සඳහා රථයේ ඒජන්ත සමාගම වන AMW ආයතනය වෙත භාර දී ඇත. පැවති ආනයන සීමා යටතේ අලුත්වැඩියාවට අදාල බොහොමයක් කොටස් ආනයනය කිරීමට සමාගමට නොහැකි වීම මත අලුත්වැඩියාව දීර්ඝ වශයෙන් ප්‍රමාද වී ඇත. මෙම අලුත්වැඩියාවේ පැහැදිලි ප්‍රගතියක් නොමැති බැවින් ආයතනය විසින් දිගින් දිගටම අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කරන ලෙස වාචිකව මෙන්ම ලිඛිතවද දන්වා ඇත. | අළුත්වැඩියා සඳහා භාරදුන් වාහන වලට අදාළ කාර්යයන් නොපමාව අවසන්කර නිසි වේලාවට මණ්ඩලය වෙත ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ)මණ්ඩලය සතු තවාන් හා ආදර්ශ පොල් උයන් වල වාර්ෂික පොහොර අවශ්‍යතාවය සඳහා මෙ.ටො 708,175 ක පොහොර වර්ග 9 ක් සැපයීමේ කොන්ත්‍රාත්තුව 2016 ඔක්තෝබර් 25 දින පුද්ගලික සමාගමක් වෙත ප්‍රවාහන ගාස්තුව සමඟ රු.19,733,982 ක් ගෙවීම් කර තිබුණු අතර පොහොර සැපයීමේදී ප්‍රමිතියට අනුකූල නොවූ | ප්‍රමිතියෙන් තොර පොහොර තොග කඩිනමින් ඉවත්කර ගැනීමට කටයුතු කරන ලෙස අදාළ ආයතනය දැනුවත් කර ඇත. | නිසි ප්‍රමිතියකින් යුතු පොහොර මිලදී ගැනීමටත් එම පොහොර නිසි වෙලාවට ආදර්ශ පොල් උයන් හා තවාන් වෙත |

| | | |
|---|---|---|
| පොහොර වර්ග 9කින් කිලෝග්‍රෑම් 83,502.1ක්ද ලබා දී මණ්ඩලයේ තවාන් 39 ක හා ආදර්ශ පොල් උයන් 7 ක ගබඩා කර තිබුණ ද වසර 7කට ආසන්න කාලයක් ගතවුවද එම පොහොර තොග ආපසු යැවීමට මණ්ඩලය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | | ලබාදීමටත් කටයුතු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පාසිකුඩා නිලධාරි නිල නිවාසයක් ඉදිකිරීම් සඳහා වැයකල රු.14,204,853 ක මුදල වසර 5 කට වැඩි කාලයක සිට කෙරීගෙන යන වැඩ ගිණුමට ඇතුළත් කර තිබුණද මෙම ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිමකර නොතිබුණි. | පාසිකුඩා සංචාරක නිලධාරී නිල නිවස ඉදිකිරීමට අදාළව නොනිමි වැඩ ගිණුමේ රු. මිලියන 14,204,853 ක මුදලෙහි ඇතුළත් නිම කරන ලද වැඩ ප්‍රමාණයට අදාළ වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇති අතර ඉතිරි වැඩ නව කොන්ත්‍රාත් ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක වන බැවින් එයට අදාළ ගිණුම් සටහන් ගැලපීම් කිරීමට 2023 වර්ෂයේදී කටයුතු කර ඇත. | සැලසුම් ගත වැඩ පිළිවෙලක් යටතේ කාලානුරූපීව හා කාර්යක්ෂමව ඉදිකිරීම් සිදුකළ යුතුය. |
| (ආ) මණ්ඩලය විසින් කප්තුරුපාය 2 ක් ඉදිකිරීම සඳහා 2013 හා 2014 වර්ෂයන්හි රු.266,778 ක උපදේශක ගාස්තුවක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම ඉදිකිරීම් අවසන් කිරීමට හෝ ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.266,778 ක මුදලට අදාළව මඩකලපුව හා මාරවිල ප්‍රාදේශීය කාර්යාලවල ඉදිකිරීම් සිදු නොවූ බැවින් එම වටිනාකම 2023 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ ගිණුමින් ලියා හැරීමට කටයුතු කර ඇත. | ඉදිකිරීම් සිදුනොකළ ගොඩනැගිලි සඳහා ගෙවූ උපදේශක ගාස්තු ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2017 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යාපනය ප්‍රාදේශිය කාර්යාලයට අයත් දේවිපුරම් පොල් පැල තවානේ තවාන්භාර නිලධාරි නිල නිවාසය ඉදිකිරීම සඳහා රු.263,450 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් එම නිල නිවසේ ඉදිකිරීම් අවසන් කිරීමට හෝ ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යාපනය ප්‍රාදේශීය කාර්යාලයට අයත් දේවිපුරම් තවානෙහි නිලධාරී නිල නිවාසය ඉදිකිරීම සඳහා ගෙවා ඇති වටිනාකමට අදාළව කාර්යයන් මේවන විට අවසන්ව ඇති බැවින් කෙරීගෙන යන වැඩ ගිණුමෙහි සඳහන් රු.263,450 ක මුදල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. | සැලසුම් ගත වැඩ පිළිවෙලක් යටතේ කාලානුරූපීව හා කාර්යක්ෂමව ඉදිකිරීම් සිදුකළ යුතුය. |
| (ඈ)මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.488,845 ක කෙරීගෙන යන වැඩ ගිණුමට හර කර කොන්ත්‍රාත් ණයහිමි ගිණුමට බැර කර තිබුණ ද වසර 4ක් ගතවී ඇතත් මුළු කොන්ත්‍රාත්තුව නිම කර නොතිබූ අතර ලබා දී තිබූ රු.97,769 ක අත්තිකාරම් මුදල ද අයකර ගැනීමට හෝ ඉදිකිරීම් නිම කර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි. | ගම්පහ ඉදිගොල්ල නේවාසිකාගාරයේ ඉදිකිරීම් නිවැරදිව ගැලපීම් සිදුකිරීමට 2023 වර්ෂයේදී කටයුතු කර ඇත. | සැලසුම් ගත වැඩ පිළිවෙලක් යටතේ කාලානුරූපීව හා කාර්යක්ෂමව ඉදිකිරීම් සිදුකිරීමට හා කොන්ත්‍රාත් ගෙවීම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ රෝග හා පළිබෝධ මර්ධන වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සැලැස්ම තුළින් රු.මිලියන 13.75ක් වෙන් කර තිබූ අතර එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 5ක් ලැබී තිබුණි .පොල් වගාවේ ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම සඳහා රෝග හා පළිබෝධ පාලනය කෙරෙහි මණ්ඩලයේ වැඩි අවධානයක් යොමු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ ඒ සම්බන්ධයෙන් සිදු කළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සැලසුම් කළ ඉලක්කයන්ට සාපේක්ෂව සියයට 50කට වඩා අඩු වී තිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්ෂේත්‍රයේ රාජකාරී කටයුතු සිදු කරනු ලබන ක්ෂේත්‍ර නිලධාරීන් බොහෝවිට ක්ෂේත්‍රයට ගමන් කරනුයේ මෝටර් බයිසිකලය මඟින් වේ. 2022 වර්ෂයේ අප්‍රේල් මාසයෙන් පසුව රටේ පැන නැඟුනු ආර්ථික අර්බුධය හමුවේ ඉන්ධන හිඟයක් ඇති විය. මේ නිසා ක්ෂේත්‍ර කටයුතුවලට යාමට ක්ෂේත්‍ර නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම අතිශයින් ගැටළු සහගත විය. | පොල් වගාවේ ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා රෝග හා පළිබෝධ මර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමුකර කටයුතු කළ යුතුය. |
| (ආ)යටිතල පහසුකම් සංවර්ධනය සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම් යටතේ මණ්ඩලය විසින් පිළිවෙළින් 2012 හා 2013 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ පාසිකුඩා හා කුරුණෑගල නිලධාරි නිල නිවාස දෙකෙහි ඉදිකිරීම් කටයුතු නවතා තිබුණද සමාලෝචිත වර්ෂය තුළදීද යළි ඉදිකිරීම් ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණු බැවින් වසර 7 කට වැඩි කාලයක සිට ඉදිකිරීම් නාස්ති වෙමින් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 6 ක ප්‍රතිපාදන ද වෙන්කර තිබුණි . | කුරුණෑගල ප්‍රාදේශිය කළමනාකරු නිලධාරි නිල නිවාසය හා පාසිකුඩා නිලධාරි නිල නිවාසය ඉදිකිරිමේ දී මතු වූ ගැටළුකාරී තත්වයන් හේතුවෙන් ඉදිකිරිම් කටයුතු අවසන් කිරීමට සැලකිය යුතු කාලයක් ගත වී ඇත. | සැලසුම් ගත වැඩ පිළිවෙලක් යටතේ කාලානුරූපීව හා කාර්යක්ෂමව ඉදිකිරීම් සිදුකළ යුතුය. |
| (ඇ)මූල්‍ය සහය ලබා දීම තුළින් පොල් ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ කප්රුක ආයෝජන ණය වැඩසටහන මඟින් ඇප ආවරණ ලබා දීම සඳහා රු.මිලියන 29 ක් වෙන් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් 492 ක් සඳහා රු.මිලියන 20.89 ක ඇප ආවරණ පමණක් ලබා දී තිබුණි. පොළී සහන ලබාදීම සඳහා ප්‍රතිලාභීන් 800 ක් ඉලක්ක ගත කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලාභීන් 520 කට එනම් ඉලක්ක ගත ප්‍රමාණයෙන් සියයට 65 කට පමණක් කප්රුක ආයෝජන වැඩසටහන මඟින් පොළී සහන ලබා දී තිබුණි. තවද තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා රු.මිලියන 1 ක් වෙන් කර තිබුණද එම ක්‍රියාකාරකම සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි. | 2022 වර්ෂයේ මුල් කාලය තුළ රටේ පැවති තත්ත්වය හමුවේ පොළී සහන සඳහා අයදුම්පත් ඉදිරිපත්වීම සීමා විමත් සමග භෞතික ඉලක්ක සපුරා ගැනීම අපහසු වී ඇත. එසේම එක් වගාකරුවෙක් සඳහා ව්‍යාපෘතියකට අදාළ නිදහස් කර ඇති ණය වාරික ප්‍රමාණය අනුව වෙන වෙනම පොළී සහන නිදහස් කළද භෞතික ප්‍රගතිය ගණනයේදී එක් වගාකරුවෙක් එක් ව්‍යාපෘතියක් ලෙස සලකන බැවින් මූල්‍ය ඉලක්කය සපුරා තිබුණද භෞතික ඉලක්ක අඩුවෙන් සටහන් වීම සිදු වනු ඇත. | සැලසුම් නිවැරදිව සකස් කිරීමට හා ඉලක්ක ගත සැලසුම් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)2019 වර්ෂයේදී කෑගල්ල හා ගම්පහ දිස්ත්‍රික්ක ආශ්‍රිතව ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණු සුදු මැස්සා නම් පලිබෝධකයාගේ ග්‍රහණය දිගින් දිගටම වැඩි වී 2022වර්ෂය වන විට කොළඹ, කළුතර, ගාල්ල, මාතර, පුත්තලම, කුරුණෑගල, රත්නපුර, මහනුවර, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල පොල් වගාවට ද සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී තිබුණි .සුදුමැස්සාගේ හානිය පාලනය කිරීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය 2022 ක්‍රියාකාරී සැලැස්මෙන් රු.මිලියන 85.5ක් වෙන් කර ලංකාව පුරා සිටින පොල් වගාකරුවන් කෙරෙහි අවධානය යොමුකර රෝගය පාලනය කිරීමේ කටයුතු ඒ යටතේ සැලසුම් කර තිබුණ ද විගණනය විසින් නියැදියක් ලෙස තෝරාගත් ප්‍රාදේශීය කාර්යාල වලින් ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය තුළ උක්ත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මූල්‍ය වියදමක් සිදු වී නොතිබුණි. එසේ වුවද 2022දෙසැම්බර් 31දිනට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව සුදු මැස්සාගේ හානිය පාලනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු.මිලියන 85.5ක මුදල සම්පූර්ණයෙන්ම සමාලෝචිත වර්ෂය තුළ වැයකල බව සඳහන් කර තිබුණි. | සුදු මැස්සා මර්දනයට අදාළ විශේෂ ව්‍යාපෘතියෙහි මූලික භෞතික ක්‍රියාකාරකම්වල පදනම 2022 වර්ෂයේ සැලසුම් කරන ලදි. එමෙන්ම ක්‍රියාවලියට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කාර්යය ඇතුලු අනිකුත් භෞතික කාර්යයන් 2022 වර්ෂය අගභාගයේදී වියීමත් පරිදි සිදු කිරීමට හැකි වී ඇත. | සැලසුම් නිවැරදිව සකස් කිරීමට හා ඉලක්ක ගත සැලසුම් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ)අමාත්‍යාංශ ප්‍රතිපාදන උපයෝජනය කර වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දනය සඳහා 2022 වර්ෂයේදී රු.මිලියන 111.14 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 45.13ක් ලැබී වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 37.333 ක් වියදම් කර තිබුණි. ඒ අනුව මණ්ඩලයට ලද ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7.79 ක් හෙවත් සියයට 17 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | 2022.12.06 වන දන වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දනය සඳහා රුපියල් මිලියන 8.570 ක මුදලක් පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත ලැබී තිබුණ අතර, ඒ වන විට සිදුකර තිබූ ක්‍රියාකාරකම් සඳහා හැකි අයුරින් අදාළ ප්‍රතිපාදන වැය කළද වර්ෂයේ අවසාන සති කිහිපය තුළ අපේක්ෂා කරන ලද සමහර ක්‍රියාකාරකම්වල ප්‍රගතිය 100% දක්වා ළඟාකර ගැනීමට නොහැකි විය. ඒ අනුව රුපියල් මිලියන 7.79 ක් ඉතිරි වී ඇති අතර, එම රුපියල් මිලියන 7.79 ක ප්‍රතිපාදන 2023 වර්ෂයේ අදාළ ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගෙන ඇත. | ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට හා රෝග මර්ධනය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ)කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගී කලාපය තුළ රෝගී ගස් ඉවත් කළ පොල් වගාකරුවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් කොළ කුන්දිරා පැළ ලබා දීම ,රෝගය අඩු ප්‍රදේශවලට දෙමුහුන් පොල් පැල ලබා දීම සහ විකල්ප බෝග වර්ග ලබා දීම සඳහා 2022 | සැලසුම් කළ පරිදි ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකිවූයේ සුදුසුකම් සපුරා ඇති වගාකරුවන් නොමැති වීම සහ විකල්ප බෝග සඳහා වගාකරුවන් කැමැත්තක් නොදැක්වීම වී ඇත. | ඉවත් කරන ලද පොල් ගස් වෙනුවට රෝගයට ඔරොත්තු දෙන ප්‍රතිරෝධී පැළ ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මෙන් රු.මිලියන 6.1ක වියදමක් සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ඒ වෙනුවෙන් රු.මිලියන 4 ක් පමණක් වියදම් කර තිබුණි. | | |
| (උ) දිවයිනේ පවතින පොල් ඉඩම් ප්‍රමාණය වැඩි කිරීම හා නඩත්තු කිරීම සඳහා රු.මිලියන 250.68ක් වෙන් කර තිබුණද 2022 වර්ෂයේ බීජ පොල් සැපයීම හා පොල් පැළ සිටුවීම සඳහා රු.මිලියන 113.05ක් පමණක් ලැබී තිබුණු අතර ව්‍යාපෘතිය යටතේ මුදලට පොල් පැල මිලියන 2 ක් පමණ අලෙවි කිරීම සඳහා ඉලක්ක සකස් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ බීජ පොල් ලක්ෂ 6 ක් පමණ එනම් සියයට 32ක් තරම් අඩු ප්‍රමාණයක් අලෙවි කර තිබුණි .තවද අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ බීජ පොල් පැළ මිලියන 1.6 ක් ලබා දීම සඳහා ඉලක්ක සකස් කර තිබුණද බීජ පොල් පැළ ලක්ෂ 9ක් පමණ එනම් ඉලක්ක ගත ප්‍රමාණයෙන් සියයට 56ක් පමණක් ලබා දී තිබුණි . | 2022 වර්ෂය ආරම්භයේදී පොල් පැළ මිලි.7.5 නිෂ්පාදනය කිරීමට සැලසුම් කරන ලදි. පැළ ඉලක්කය සපුරාලීමට අවශ්‍ය බීජ පොල් තවාන්වලට ප්‍රවාහනය කරමින් සිටින අතරතුර රටේ උද්ගත වූ ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය මත රජය මඟින් පැළ ලබාගැනීමට සැලසුම් කර තිබූ හරිත දැයක් සහ ගම සමඟ පිළිසඳරක් වැඩසටහන් අහෝසි කරන ලදි. තවද විමධ්‍යගත අරමුදල යටත් දිස්ත්‍රික්ක ලේකම්වරු මඟින් ලබාදීමට තිබූ පැළ ද ප්‍රතික්ෂේප කරන ලදි. මෙම තත්ත්වය යටතේ අතිරික්ත පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය වන බැවින් පැළ මිලි.75 ක් සඳහා බීජ පොල් ප්‍රවාහනය වහාම අත්හිටුවන ලදි. නමුත් ඒ වන විටත් පැළ මිලි. 5ට ගැලපෙන බීජ පොල් මිලි.7.1 ප්‍රවාහනය කර තිබුණි. ඒ අනුව පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන්වල 2022 වර්ෂයට අදාළව පොල් පැළ මිලි.5.00 නිෂ්පාදනය වෙමින් තිබී ඇත. | නිසි සැලසුම්ගත ඉලක්කයන් සහිතව දිවයිනේ පවතින පොල් ඉඩම් ප්‍රමාණය වැඩිකිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |